# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 16 දරන
# විද්‍යාරණ්‍ය විනය ක්‍රම සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1986 ජූලි මස 24 වන දින]**

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---


**1986 ජූලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

**මිළ : ශත 60 යි** **තැපැල් ගාස්තුව : ශත 75 යි**

# 1986 අංක 16 දරන විද්‍යාරණ්‍ය විනයක්‍රම සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 ජූලි මස 24 වන දින.]

එල්. ඩී—ඕ. 29/85

## විද්‍යාරණ්‍ය විනයක්‍රම සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"විද්‍යාරණ්‍ය විනයක්‍රම සභාව" නමින් හැඳින්වෙන සහ ප්‍රකට සභාවක් එහි සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව ඒ සභාවට සම්බන්ධ සියලු කරුණු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කර ගෙන යාම පිණිස 1952 පෙබරවාරි මස 24 වන දින කොළඹ දී පිහිටුවා ගෙන ඇති හෙයින් ද: පූර්විකාව.

එකී සභාව පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු එකී සභාව විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සභාව සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින්ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින්ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1986 අංක 16 දරන විද්‍යාරණ්‍ය විනයක්‍රම සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යාරණ්‍ය විනයක්‍රම සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භවන දිනයෙහි සිට සහ ඉන්පසුව "විද්‍යාරණ්‍ය විනයක්‍රම සභාව" යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්විය යුතු අතර, සියලු අධිකරණවල දී එකී නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි ඒ මුද්‍රාව වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. විද්‍යාරණ්‍ය විනයක්‍රම සභාව සංස්ථාගත කිරීම.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුයයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බුද්ධ ධර්මය සහ බෞද්ධ විනය ගැන දැනීම ගිහි පැවිදි යන දෙපාර්ශ්වය තුළම වැඩිදියුණු කිරීම;

(ආ) සමාජ ශෝධනය සහ සමාජ සංවර්ධනය සඳහා රට පුරා බෞද්ධ ධර්මදූත මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

ම 083232—6,700 (85/04)

(ඇ) සමාජ ශෝධනයට ඇපකැප වූ ද භික්ෂූන් පිරිසක් විසින් මඟ පෙන්වනු ලබන්නා වූ සහ සහාය දෙනු ලබන්නා වූ ද (ලෞකික ජීවිතයෙන් ඈත් වූ) අනගාරික පිරිසක් සංවිධානය කිරීම ;

(ඈ) වෛද්‍ය, ජ්‍යොතිෂාදී පැරණි ශාස්ත්‍ර වැඩි දියුණු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා අභ්‍යාස ආයතන පිහිටුවීම ;

(ඉ) ධර්ම ශාස්ත්‍ර සහ භාෂා ශාස්ත්‍ර පිළිබඳ පැරණි ඉගැන්වීම් ක්‍රම පුනරුත්ථාපනය කිරීම ;

(ඊ) බෞද්ධ ධර්මය සහ ශාස්ත්‍රීය ග්‍රන්ථඥානය පිළිබඳ විභාග පවත්වා ඒ විභාගවලින් සමත් වන අයට උපාධි ආදිය පිරිනැමීම ;

(උ) බෞද්ධ ධර්මදූත ප්‍රචාරක කටයුතු දියුණු කිරීම සඳහා පොත් පත් ආදිය සකස් කොට, මුද්‍රණය කොට, ප්‍රකාශයට පත් කිරීම සහ ඒ පොත් පත් මහජනයා අතර, විශේෂයෙන්ම, බන්ධනාගාරයන්හි සිටින සිරකරුවන් අතර බෙදා හැරීම ;

(ඌ) ශමථ විදර්ශනා භාවනා ක්‍රමය රට පුරා පතුරුවාලීම ;

(එ) පන්සිල් සහ දශකුසල් පුරන දැහැමි සමාජයක් ඇති කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ; සහ

(ඒ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික හෝ හිතකර වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම සහ ඒවාට ධෛර්ය දීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් ලබා ගැනීමේ සහ එකතු කිරීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතරින් යම් කිසිවක් උන්නතියට පත් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන කවර ආකාරයේ වුවද සියලු ක්‍රියා කිරීමේත් සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ කිරීමේත් බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන, නම් කරනු ලබන හෝ පත් කරනු ලබන වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් වෙත, සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ සාමාන්‍ය පරිපාලනය සහ කළමනාකරණය පවරනු ලැබිය යුතුය.

(2) සංස්ථාවේ එකී රීතිවලට අනුකූලව ආංශික මණ්ඩල සහ කමිටු පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ එක් එක් ආංශික මණ්ඩලය හෝ කමිටුව යම් විශේෂ ක්ෂේත්‍රයක කටයුතු සංවිධානය කිරීම සහ සංවර්ධනය කිරීම භාරව ක්‍රියා කළ යුතුය.

6. (1) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින හා ඡන්දය දීමට සුදුසුකම් ලත් සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේය :—

(අ) සාමාජික සංවිධාන ඇතුළු කර ගැනීම, ඒවා ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) කළමනාකාර මණ්ඩලයට හෝ විවිධ කමිටුවලට සාමාජිකයන් නම් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් සහ ඔවුන් තෝරා පත් කරගනු ලැබිය යුතු ආකාරය කළමනාකාර මණ්ඩලයේ සහ ඒ ඒ කමිටුවල සාමාජිකයන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කැසිරීම සහ කාර්ය භාරය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ කළමනාකාර මණ්ඩලයේ සහ විවිධ කමිටුවල රැස්වීම් කැඳවිය යුතු සහ පැවැත්විය යුතු ආකාරය, ඒ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම් පැවැත්විය යුතු ස්ථානය, වේලාව සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒ රැස්වීම්වල න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කරනු ලැබිය යුතු කරුණු;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ කවර වුවද රීතියක් (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන්ම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකිය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත් තාහ.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකිබව.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය සහිතව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතුය.

සභාව විසින් ගෙවිය යුතු ණය හා සභාවට අයවිය යුතු ණය.

8. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ආරම්භ වන අවස්ථාවේ දී පැවති සභාවේ සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සභාවට අයවිය යුතු සියලු ණය හා සභාවට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො විය යුතුය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.